# දඟ පැංචාට පාඩමක්



සවින්ද්‍යා වරණී කාරියවසම්

# දඟ පැංචාට පාඩමක්

## සවින්දයා වරණී කාරියවසම්

කතෘ

කතෘගේ වෙනවත් කෘති

**සමඟිය සතුට ගෙනේ.**


මහාමායා බාලිකා විදුහල

3 ශ්‍රේණිය A


2026-05-10


ISBN අංකය - 978-624-211-015-8

# පිදුම

මෙම නිර්මාණය කිරීමට

මා උනන්දු කළ

මාගේ ආදරණීය දෙමව්පියන්ටත්,

ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත්

මෙම පොත

ගෞරවයෙන් පිළිගන්වමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සීදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

එකෝමත් එක කැලෑවක ලොකු ගසක් තිබුණා. ඒ ගසේ අත්තක පුංචි කුරුලු කූඩුවක් තිබුණා. මේ කුරුලු කූඩුවේ පුංචි පැටියෙක් හිටියා. කුරුලු අම්මායි, කුරුලු තාත්තයි හරිම ආදරෙන් මේ පැටියාව රැකබලා ගත්තා.



ඒ කුරුලු කූඩුව හරිම ලස්සනයි. ඉතින් මේ කුරුලු අම්මා එයාගේ ගෙදර හරිම ලස්සනට සරසලා තිබුණා. පුංචි කුරුලු පැටියාගේ කීචී බීචී සද්දය මේ කුරුලු ගෙදරට තවත් සිරියාවක් එකතු කළා. කුරුලු අම්මයි, කුරුලු තාත්තයි, පුංචි කුරුලු පැටියයි හරිම සතුටින් කාලය ගත කළා.

කුරුලු තාත්තා උදේන්ම එළියට පියාඹලා ගිහින් කුරුලු පැටියටයි, අම්මාටයි ඇතිවෙන්න කෑම හොයාගෙන ගෙනත් දෙනවා. කුරුලු අම්මා පැටියාව බලාගෙන කුරුලු කූඩුව තවත් ලස්සනට හැඩ කරගෙන හිටියා.

කැලෑවේ හිටපු අනිත් සතුන්ටත් මේ කුරුලු කූඩුව ගැන හරිම සතුටුයි. "හරිම සතුටින් ජීවත්වන කුරුලු පවුලක්" අනිත් සත්තු කිව්වේ එහෙම. කාලේ මෙහෙම ගෙවිලා යද්දී කුරුලු පැටියාත් ටික ටික ලොකු වුණා. දැන් කුරුලු පැටියාව ගෙදර තනියම තියල කුරුලු අම්මයි තාත්තයි දෙන්නාම කෑම හොයන්න යනවා.



“පුතේ අපි කෑම හොයාගෙන එනකම් පරිස්සමට **කූඩුව** ඇතුලට වෙලාම ඉන්න. **කූඩුවෙන්** එළියට ඔලුව දාන්න එහෙම එපා. ඔයාව **කූඩුවෙන්** බිමට වැටෙයි.” මේ විදියට ගොඩක් අවවාද දීලා තමයි අම්මයි තාත්තයි දෙන්නා පිටත්වෙලා යන්නේ.


ඒත් මේ කුරුලු පැටියාට නම් ඕන වුණේම කුරුලු කූඩුවෙන් එළිය මොන වගේද කියල දැනගන්න. හරිම ආසාවක් තමයි තිබුණේ ඈත ආකාසේ පියාඹලා යන්න. දවසක් අම්මයි තාත්තයි එළියට යනකම් ඉඳලා මේ කුරුලු පැටියා කූඩුවෙන් ටිකක් එළියට ඔලුව දාලා බැලුවා. "ෂා... හරිම ලස්සනයි. මල් පිපිලා ඈත කැලෑව හරිම ලස්සනට පේනවා." කුරුලු පැටියා තනියම හිතුවා. එයා තව ටිකක් කූඩුවෙන් එළියට එබුණා.

අනේ එකපාරට ම කුරුළු පැටියා එළිය පැත්තට බර වැඩි වෙලා කූඩුවෙන් එළියට වැටුණා. තණකොළ වැවිලා තිබුණු නිසා පැටියාට මුකුත් වුණේ නම් නැහැ. එයා අත්තටු ගසලා පියාඹන්න හැදුවා. "පියාඹන්න ටික ටික පුරුදු වෙන්න ඕන. එක පාරටම බැහැ." අම්මා දවසක් කිව්වා කියල පැටියට මතක් වුණේ එතකොට. "අනේ මට දැන් මොනවා වෙයිද?" හොඳටම බය වුණු කුරුළු පැටියා හයියෙන් කෑ ගැහුවා.



කැලේ හිටි අනෙක් සතුන්ටත් මේ සද්දෙ ඇහුණා. "කුරුලු පැටියා අද නම් හරිම අමුතු විදිහටයි කෑගහන්නේ. වෙනදා වගේ සතුටින් නම් නෙමෙයි වගේ. කුරුලු අම්මයි තාත්තයි දෙන්නත් කෑම හොයන්න උදෙන් ම යනවනේ. පැටියට මුකුත් කරදරයක්ද දන්නෑ. කෝකටත් අපි ටිකක් ගිහින් බලමු." අනික් සත්තු එහෙම හිතලා කුරුලු කූඩුව පැත්තට දුවගෙන ගියා.

"අනේ... මෙන්න කුරුළු පැටියා බිමට වැටිලා." හා පැංචා කුරුළු පැටියාව දැකලා කෑ ගැහුවා. "අනේ පව් එයා හොඳටම බය වෙලා" හා පැංචා කුරුළු පැටියව අතට ගත්තා. "මෙයාව අපි කොහොමද කූඩුවෙන් තියන්නේ" හා පැංචා එහෙම ඇහුවා. "කෝ දෙන්න මම එයාව කූඩුවෙන් තියන්නම්." අලියා කිව්වා. අලියා හරිම පරිස්සමට හොඬවැලෙන් අරගෙන කුරුළු පැටියාව එයාගේ කූඩුවෙන් තිබ්බා.



කෑම හොයාගෙන එන කුරුළු අම්මාටයි තාත්තාටයි ඇතටම මේ කලබලය ටිකක් ඇහුණා. එයාල ටිකක් ඉක්මනින් කූඩුව පැත්තට පියාඹගෙන ආවා. ඈතින් පියාඹාගෙන එන අම්මයි තාත්තයි දැකලා කුරුළු පැටියා හයියෙන් ඇඬුවා. "අනේ ඇයි ඇයි පුතේ මේ අඬන්නේ? මොකද වුණේ" අම්මා පැටියාට ලං වෙලා ඇහුවා. කුරුළු පැටියා අඬ අඬාම වෙච්ච දේ අම්මාටයි තාත්තාටයි කිව්වා. "අනේ අම්මේ තාත්තේ මට සමාවෙන්න. මම ආයෙත් ඔයාලා එපා කියන දේ කරන්නේ නෑ. මම පොරොන්දු වෙනවා" එහෙම කියලා කුරුළු පැටියා අම්මාටයි තාත්තාටයි තුරුළු වුණා.

"පේනවා නේද අපි කවදාවත් අපේ වැඩිහිටියෝ එපා කියන දෙයක් කරන්න හොඳ නෑ. එහෙම කළොත් අපිට විපතක්මයි වෙන්නේ" එහෙම කියපු කුරුලු තාත්තා පැටියාගේ ඔලුව හෙමීට අත ගෑවා. ආය කිසිම දවසක අම්මයි තාත්තයි එපා කියන දෙයක් කරන්නේ නෑ කියලා පුංචි කුරුලු පැටියා හොඳින්ම හිතට ගත්තා.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු කර වීම වව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොත්පත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොත්පතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් “හේමමාලා උපහාර” ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටු කළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ. කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරිය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

(ව්‍යාපෘති නිරිර්මාතෘ)

ISBN අංකය - 978-624-211-015-8